ETHICS EYE
පිටු මායිමෙන් ඔබ්බට




# Ethics Eye මාර්ගෝපදේශන සංග්‍රහය 2020

# පටුන

පෙරවදන ........................................ 1
1. වැරදි පුවත් වාතර්ාකරණය ........................................ 3
2. නිවැරැදි කිරීම් හා සමා අයැදීම/ පිළිතුරු දීමට අවස්ථා ........................................ 3
3. පුවත්පත් වාතර්ාවක/ලිපියක මූලාශ්‍ර පළ කිරීම සහ රහස්‍ය මූලාශ්‍ර ........................................ 4
4. අපරාධ /සමාජ ප්‍රශ්ණ පිළිබඳ පුවත් පළ කිරීමේදී ........................................ 4
5. ආගමික /ජනවාගර්ික පුවත් පළ කිරීමේදී ........................................ 5
6. දිවි අහිමි කරගැනීම  සම්බන්ධ පුවත් පළ කිරීමේදී ........................................ 5
7. පෞද්ගලිකත්වය /පෞද්ගලික තොරතුරු පළ කිරීමේදී ........................................ 6
8. කොන්කිරීම් /වෙනස්කොට සැලකීම්/අගතිසහගත සහ අවඥාසහගත සඳහන් කිරීම් ........................................ 7
9. බාලවයස්කරුවන් සම්බන්ධ වාතර්ා කරණයන් ........................................ 7
අථර් නිරූපණය ........................................ 8

# පෙරවදන

Ethics Eye යනු, ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වූ මාධ්‍ය සංස්කෘතියක් පෝෂණය කිරීම උදෙසා කටයුතු කරනා, පර්යේෂණ මත පදනම් වූ ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකාවේ එදිනෙදා වාර්තාකරණය තුළ දක්නට ලැබෙනා මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයන් හා ඊට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු විෂයෙහි මාධ්‍ය ක්ෂේත්‍රය සමගත්, පොදුජනයා සමගත් සම්බන්ධ වන්නට හා ඔවුන්ව දැනුවත් කරන්නට අපි කටයුතු කරමු.

මාධ්‍ය ආචාර ධර්ම යනුවෙන් මෙහිදී හැඳින්වෙන්නේ, මාධ්‍යකරණයේදී පිළිපැදීමට දිරිගැන්වෙන යම් ප්‍රතිපත්ති හා සම්මතයන් වේ. මෙවන් මාධ්‍ය ආචාර ධර්මයන් පැවතීමේ අවශ්‍යතාවය වන්නේ, යම් පාර්ශවයන්ට හෝ පුද්ගලයින්ට හෝ පුද්ගල කණ්ඩායම් වලට හෝ පොදුවේ මහජනතාවට මාධ්‍යකරණය ඔස්සේ අගතීන් හෝ කොන් කිරීම් සිදුවීම වැළැක්වීමටත්, මාධ්‍යකරණයේ වෘත්තීය ගෞරවය ආරක්ෂා කිරීමටත් වේ. මාධ්‍ය මගින් වාර්තාකරණයේදී මෙම මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීම අතිශයින්ම අවශ්‍ය කරුණක් වන්නේත් එනිසායි.

අප විසින් ඉදිරිපත් කරන මෙම මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය සම්පාදනය සඳහා, ශ්‍රී ලංකාවේ කර්තෘ සංසදය මගින් හඳුන්වා දී ඇති වෘත්තීය ප්‍රතිපත්ති මාලාවත්, යම් ක්ෂේත්‍රයන් සඳහා ලෝකයේ වෙනත් පිළිගත් අධිකාරීන් සහ ආයතන මගින් හඳුන්වා දී ඇති ආචාර ධර්ම සංහිතාවන්ද පරිශීලනය කොට ඇත.

මෙම Ethics Eye මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය, මාධ්‍ය වෘත්තිකයින් හටත්, මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුව සහ අදාළත්වය ඇති විද්‍යාර්ථීන් හටත්, පාඨක ප්‍රජාව හටත් එකසේ වැදගත් වනු ඇතැයි අපි සිතමු. ඒ ඔස්සේ වඩාත් යහපත්, වඩාත් ආචාර ධාර්මික මාධ්‍යකරණයක් ශ්‍රී ලංකාව තුළ ඇතිවනු ඇතැයි අපි උදක්ම අපේක්ෂා කරමු.

# <u>පුවත්පත් මාධ්‍ය ආචාර ධර්ම මාලාව</u>

**<u>1. වැරදි පුවත් වාර්තාකරණය</u>**

1-1 පුවත්පත් සැමවිටම සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ විකෘති කළ තොරතුරු (ඡායාරූපද ඇතුළත්ව) ප්‍රකාශයට පත් නොකිරීමට වග බලා ගත යුතුය.[1]

**<u>2. නිවැරදි කිරීම් හා සමා අයැදීම/ පිළිතුරු දීමට අවස්ථා</u>**

2-1 යම් කිසි පළවූ වාර්තාවක් කරුණු අතින් වැරදියැයි කතෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් ඇතිව සහ යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක් ද ඇතිව, එම නිවැරදි කිරීම හා සමා අයැදීම පීඩිත පාශර්වයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම පළ කොට එය නිවැරදි කළ යුත්තේය.[2]

2-2 කරුණු අතින් සාවද්‍ය ප්‍රකාශන නිසා පුද්ගලයන්ගේ හෝ සංවිධානවල හෝ කීතර්ියට ගෞරවයට, නම්බුවට, හැඟීම්වලට පෞද්ගලිකත්වයට හා නිලයට හානි සිදුවන්නේ නම්, ඒ ප්‍රකාශනවලට පිළිතුරු දීම සඳහා සාධාරණ හා යුක්ති සහගත අවස්ථාවක් ඒ පුද්ගලයනට හෝ සංවිධානවලට හෝ දිය යුත්තේය. එම පිළිතුරු සිය කරුණු පැහැදිලි කිරීම සඳහා පැමිණිළිකරු/පැමිණිළිකාරිය කරන ප්‍රකාශයට සීමා විය යුතු අතරම, සිදුවිණැයි කියන වරද නිවැරදි කිරීම පිණිස අවශ්‍ය ප්‍රමාණයට වඩා එය දීසර් ද නොවිය යුත්තේය.[3]

2-3 වරද ගැන සමාව අයැදීම හෝ කනගාටුව පළ කිරීම වෙනුවට පැමිණිළිකරු/පැමිණිළිකාරියගේ පිළිතුරට ප්‍රතිචාර දක්වන කතුවරු හෝ පුවත්පත් කලාවේදියෝ ඊට පිළිතුරු දීමේ තවත් අවස්ථාවක් අතෘප්ත පාශර්වයට නැවත ප්‍රතිචාර දැක්වීමට අවකාශය සැලසිය යුතුය.[4]

---

[1] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය),* ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php.; *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/

[2] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/; ඉන්දියානු පුවත්පත් මණ්ඩලය (2010), *Norms of Journalistic Conduct* (*ජනමාධ්‍ය භාවිතාවේ සම්මතයන්*), පි. 17 (14, i.), ප්‍රවේශය: http://www.presscouncil.nic.in/OldWebsite/NORMS-2010.pdf.

[3] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

[4] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/; ද රෙනෝල්ඩ්ස් ජනර්ලිස්ම් ඉන්ස්ටිටියුට් ඇන්ඩ් එතිකල් ජනර්ලිස්ම් නෙට්වකර් (n.d), *Accountable Journalism (වගකීම් සහගත මාධ්‍යකරණය)*, ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/Fiji-General.

**3. පුවත්පත් වාතර්ාවක/ලිපියක මූලාශ්‍ර පළ කිරීම සහ රහස්‍ය මූලාශ්‍ර**

3-1 තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා කළ යුතු මූලාශ්‍ර, එය අනාවරණය කිරීමේ අවසරය ඒ මූලාශ්‍රයෙන්ම නොලැබෙන තෙක් හෙළිදරව් නොකිරීමේ සදාචාරත්මක වගකීමක් සෑම පුවත්පත් කලාවේදියකුටම/වේදිනියකටම ඇත්තේය.[5]

3-2 මූලාශ්‍ර සඳහන් නොකර සිටිය හැකි අවස්ථාවන් වන්නේ ,

- පුවතට අවැසි කරුණ තොරතුරක් මිස මතයක් හෝ අනුමානයක් නොවන අවස්ථාවක සහ එම කරුණ පුවතට අත්‍යාවශ්‍ය වන විට.
- මූලාශ්‍රය තොරතුරු ලබාදෙන්නේ එම මූලාශ්‍රයේ අනන්‍යතාවය හෙළි නොකර සිටින්නේ නම් පමණක් යැයි කොන්දේසියක් පනවන අවස්ථාවක.
- මූලාශ්‍රය විශ්වාසනීය සහ නිවැරදි තොරතුරු ලබාදීමට සමත් වනවිට.[6]

**4. අපරාධ /සමාජ ප්‍රශ්ණ පිළිබඳ පුවත් පළ කිරීමේදී**

4-1 කම්පන හෝ හිත් වේදනා ඇති කරන ආකාරයේ සමාජ ප්‍රශ්න, එනම්, කෲරත්වය, ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය අපයෝජනය, දූෂ්ටත්වය, පරපීඩා/කාමුකත්වය, ලිංගික පීඩනය හා අශිෂ්ටත්වය ද යනාදිය පිළිබඳ කරුණු වාතර්ා කිරීමේ දී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්ව ද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය.[7]

4-2 අපරාධ හා අපරාධ නඩු පිළිබඳ තොරතුරු හා වාතර්ා කිරීමේ දී ප්‍රකාශන නීතියෙන් හා පොදු ජන යහපත පිළිබඳ සාධකයෙන් ද යන දෙවිදියෙන්ම අවසර ලැබෙතොත් විනා එසේ නොවේ නම්:

- ලිංගික අපරාධවලට ලක්වූවන්ගේ නම/ අනන්‍යතාවය හෙළිදරව් නොකළ යුතුය.
- අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා හෝ දඬුවම් හෝ ලැබූ පුද්ගලයකුගේ ඥාතීන්ගේ අනන්‍යතාව සාමාන්‍යයෙන් ඔවුන්ගේ කැමැත්ත නැතිව හෙළිදරව් නොකළ යුත්තේය.[8]

---

[5] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/; ද රෙනෝල්ඩ්ස් ජනර්ලිස්ම් ඉන්ස්ටිටියුට් ඇන්ඩ් එතිකල් ජනර්ලිස්ම් නෙට්වකර් (2013), *Sources (මූලාශ්‍ර),* ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/international-code-of-practice-of-caribbean-journalists.

[6] ද ඇසෝසියේටඩ් ප්‍රෙස්, *Anonymous Sources (අඥාත මූලාශ්‍ර),* ප්‍රවේශය: https://www.ap.org/about/news-values-and-principles/telling-the-story/anonymous-sources.

[7] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

[8] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය),* ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php; *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

**5. ආගමික /ජනවාගරීක පුවත් පළ කිරීමේදී**

5-1 පුවත්පත් කලාවේදියෙක් දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාගරීක හෝ ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුත්තේය.[9]

**6. දිවි අහිමි කරගැනීම සම්බන්ධ පුවත් පළ කිරීමේදී**

6-1 දිවි අහිමි කරගැනීම් නුවුමනා ලෙසින් සංවේගය/උද්වේගය ඇතිකරනා ආකාරයෙන්, දිවි අහිමි කරගැනීම් උත්කෂර්යට නංවමින්, හෝ එය සුළු කොට දක්වමින් වාතර්ා නොකළ යුතුය. එමෙන්ම දිවි අහිමි ගැනීමේ ක්‍රියාව හා එය තැත් කරන පුද්ගලයන්ව ගහර්ාවට ලක් නොකළ යුතුය.[10]

6-2 දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් ප්‍රමුඛත්වයෙන් පළ නොකළ යුතුය. පුවත්පත තුල මෙවැනි වාතර්ා පළ විය යුත්තේ ඇතුල් පිටුවක පහළ කොටසට වන්නට මිස, මුල් පිටුවේ හෝ ඇතුල් පිටුවක උඩ කොටසේ නොවේ.[11]

6-3 දිවි අහිමි කරගත් ආකාරය දීසර් ලෙස විස්තර නොකළ යුතුය.[12]

6-4 "සියදිවි නසා ගැනීම/ දිවිතොර කරගැනීම" යන්න සිරස්තලයෙහි සඳහන් නොකළ යුතුය. එමෙන්ම ක්‍රමය හෝ ස්ථානය පිළිබඳ පැහැදිලි සඳහනක් සිරස්තලයෙහි නොදැක්විය යුතුය. සිරස්තලය ප්‍රධාන පුවත ලියන කතුවරයා මිස වෙනත් මාධ්‍ය වෘත්තිකයෙක් විසින් ලියනු ලැබේ නම්, එම වෘත්තිකයා කතුවරයා සමග සාකච්ඡා කොට සුදුසු සිරස්තලයක් තෝරා ගත යුතුය.[13]

6-5 ඉංග්‍රීසි පුවත්පත් වාතර්ාකරණයේදී committed suicide වෙනුවට died by suicide/ took his/her life/killed him/herself යෙදිය යුතුය.

6-6 දිවි අහිමි කරගැනීමක් සිදු වූ ස්ථානයක ඡායාරූප, වීඩියෝ දශර්න හෝ සමාජ මාධ්‍ය සබැඳි, විශේෂයෙන් ස්ථානය හෝ ක්‍රමවේදය පිළිබඳ නිශ්චිත තොරතුරු, පළ නොකළ යුතුය.[14]

---

[9] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව*, ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/; ද රෙනෝල්ඩ්ස් ජනර්ලිස්ම් ඉන්ස්ටිටියුට් ඇන්ඩ් එතිකල් ජනර්ලිස්ම් නෙට්වකර් (n.d), *Accountable Journalism (වගකීම් සහගත මාධ්‍යකරණය)*, ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/Fiji-General.

[10] ඔස්ට්‍රේලියානු පුවත්පත් මණ්ඩලය (2014), *Specific Standards on Coverage of Suicide (සියදිවි නසාගැනීම් ආවරණය සඳහා නිශ්චිත ප්‍රමිතීන්)*, පි.2 ප්‍රවේශය: https://www.presscouncil.org.au/uploads/52321/ufiles/SPECIFIC_STANDARDS_SUICIDE_-_July_2014.pdf.

[11] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*, පි.6, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

[12] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*, පි.7, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

[13] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*, පි.7, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

[14] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවි නසා ගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*, පි.7, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

6-7 සියදිවි හානිකරගත් පුද්ගලයා ලියූ ලිපි  පළ නොකළ යුතුය.[15]

6-8  දිවි අහිමි කරගන්නා පොදු ස්ථාන පිළිබඳව සඳහන් කිරීම, එවැනි ස්ථාන තිබෙන බව හැඟවීම, සහ එම ස්ථාන වල තොරතුරු ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.[16]

6-9 සිය දිවි නසා මියගිය පුද්ගලයෙකුගේ පින්තූර භාවිතා කිරීමේදී විශාල ප්‍රවේශම් වීමක් අවශ්‍ය වේ. පින්තූර භාවිතා කරන්නේ නම්, පවුලේ සාමාජිකයන්ගෙන් පැහැදිලි අවසරයක් ලබා ගත යුතුය. එමෙන්ම මෙම පින්තූර කැපී පෙනෙන ලෙස ස්ථානගත නොකළ යුතු අතර දිවි අහිමි කරගත් පුද්ගලයාට හෝ දිවි අහිමි කරගැනීමට පාදක ආශක්තභාවය ලැබෙන ලෙසින් ඒවා පළ නොකළ යුතුය.[17]

6-10 සියදිවි හානිකරගත් හේතුව ඉතා සරලව නොදැක්විය යුතු අතර උපකාරක අංකයක් (උදාහරණ ලෙස :-සුමිත්‍රයෝ 0112696666/ CCC line: 1333 / National Institute of Mental Health: 1926 ) පිළිබඳ ලිපිය තුළ සඳහන් කිරීම යෝග්‍ය වේ.[18]

**<u>7. පෞද්ගලිකත්වය /පෞද්ගලික තොරතුරු පළ කිරීමේදී</u>**

7-1 පුද්ගලයන්ගේ පෞද්ගලික හා පවුල් ජීවිත ඔවුන්ගේ ගේ-දොර, සෞඛ්‍යය හා සහසම්බන්ධතා ද ඩිජිටල් සන්නිවේදනය කෙරෙහි ගෞරවයක් දැක්වීමෙහිලා පුවත්පත් විශේෂ සැලැකිල්ලකින් ක්‍රියා කළ යුත්තේය. පෞද්ගලිකත්වයට ඇති මේ අයිතිය අදාල පුද්ගලයන්ගේ කැමැත්තෙන් තොරව ආක්‍රමණය කිරීම සාධාරණීකරණය කළ හැක්කේ පොදුජන සුබ සිද්ධිය ඒ සියල්ල ඉක්මවා යන්නේ නම් පමණකි.[19]

---

[15] සමාරිටන්ස් (2017), *Guidelines for Reporting on Suicide (සියදිවි නසාගැනීම් වාතර්ාකරණය සඳහා මාගෙර්ාපදේශ)*, පි.15, ප්‍රවේශය: https://media.samaritans.org/documents/Samaritans_Media_Guidelines_UK_Apr17_Final_web.pdf.

[16] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවිනසාගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*; පි.7, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

[17] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවිනසාගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*; පි.7, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1.

[18] ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සියදිවිනසාගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (2017), *Preventing suicide: a resource for media professionals (සියදිවි නසා ගැනීම වැළැක්වීම: මාධ්‍ය වෘත්තිකයින් සඳහා වන මූලාශ්‍රයක්)*; පි.6, ප්‍රවේශය: https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1; සමාරිටන්ස් (2017), *Guidelines for Reporting on Suicide (සියදිවි නසාගැනීම් වාතර්ාකරණය සඳහා මාගෙර්ාපදේශ)*, පි.15, ප්‍රවේශය: https://media.samaritans.org/documents/Samaritans_Media_Guidelines_UK_Apr17_Final_web.pdf.

[19] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව,* ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/; එඩිටර්ස් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php; ද රෙනෝල්ඩ්ස් ජනර්ලිස්ම් ඉන්ස්ටිටියුට් ඇන්ඩ් එතිකල් ජනර්ලිස්ම් නෙට්වර්ක් (n.d), *Accountable Journalism (වගකීම් සහගත මාධ්‍යකරණය)*, ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/Fiji-General; ඉන්දියානු පුවත්පත් මණ්ඩලය (2010), *Norms of Journalistic Conduct (ජනමාධ්‍ය භාවිතාවේ සම්මතයන්)*, පි. 12, ප්‍රවේශය: http://www.presscouncil.nic.in/OldWebsite/NORMS-2010.pdf.

7-2 පෞද්ගලිකත්වය පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් සහිතව පොදු හෝ පෞද්ගලික ස්ථානයන්හි සිටිනා අයවලුන්ව, ඔවුන්ගේ අනුමැතියකින් තොරව ඡායාරූපගත කිරීම පිළිගත නොහැකි වේ.[20]

**8. කොන්කිරීම් /වෙනස්කොට සැලකීම්/අගතිසහගත සහ අවඥාසහගත සදහන් කිරීම්**

8-1 පුද්ගලයකුගේ වගර්ය, වණර්ය, ආගම, ලිංගික නැඹුරුතාවය, ලිංගිකත්වය (ස්ත්‍රී/පුරුෂ භාවය) පිළිබඳවත් ශාරීරික වෙනස්කමක් හෝ මානසික රෝගාබාධ පිළිබඳවත් අගති සහගත හා අවඥාසහගත කරුණු සඳහන් කිරීමෙන් පුවත්පත් වැළැකිය යුත්තේය. ඉහත කරුණු පාදක කරගනිමින් වාතර්ාවක් හෝ ලිපියක් තුළ වෙනස් ලෙසින් සැලකීම නොකළ යුතුය.[21]

8-2 පුද්ගලයකුගේ වගර්ය, කුලය, ආගම, ලිංගික නැඹුරුතා, ශාරීරික වෙනස්කමක් හෝ මානසික රෝගාබාධ පිළිබඳ විස්තර, පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුත්තේය.[22]

**9. බාලවයස්කරුවන් සම්බන්ධ වාතර්ා කරණයන්**

9-1 සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලත් වයස අවුරුදු 16 ට අඩු හා පෙර දඬුවම් නැති කිසිදු බාලවයස්කරුවෙකුගේ නම, අනන්‍යතාවය හෙළි කරගත හැකි කරුණු දැන දැනම අනාවරණය නොකළ යුතුය.[23]

9-2 ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක්වූ බාලවයස්කරුවෙකු සම්බන්ධ අවස්ථාවක ඕනෑම මාධ්‍ය වාතර්ාවක:

- බාලවයස්කරු හඳුන්වා දිය යුතු නොවේ.
- වැඩිහිටියාගේ අනන්‍යතාවය හඳුන්වා දිය හැක.
- බාලවයස්කාර වින්දිතයෙකු හඳුනාගත හැකි තැන "ව්‍යභිචාරය" (incest) හෝ වෙනත් ඊට සමාන වචන භාවිතා නොකළ යුතුය.
- චූදිතයා සහ බාලවයස්කරු අතර ඇති සම්බන්ධය පිළිබඳව කිසිවක් වාතර්ාවේ ඇඟවුම් නොකිරීමට වගබලා ගත යුතුය.[24]

---

[20] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Privacy (පෞද්ගලිකත්වය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php.

[21] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php; *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව*, ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/

[22] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php; *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව*, ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

[23] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව*, ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

[24] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice(සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php; ස්වාධීන පුවත්පත් ප්‍රමිති සංවිධානය (n.d), *Guidance on reporting of*

9-3 සිය පාසල් සමය අනවශ්‍ය අත පෙවීම්වලින් තොරව සම්පූර්ණ කර ගන්නට බාලයනට නිදහස තිබිය යුතුය.[25]

9-4 වයස අවුරුදු 16 ට පහළ බාලවයස්කරුවන්ගෙන්, ඔවුන් හෝ වෙනත් බාලවයස්කරුවෙකුගේ සුභසාධනය සම්බන්ධ කරුණු පිළිබඳව සම්මුඛ සාකච්ඡාවන් ඔස්සේ තොරතුරු විමසීම හෝ ඡායාරූපගත කිරීම, ඔවුන්ගේ භාරකාර දෙමාපියන් හෝ ඒ හා සමාන වගකීම් සහගත වැඩිහිටියෙකුගේ අවසරය ඇතිනම් මිස නොකළ යුතු වේ.[26]

9-5 බාලවයස්කරුවෙකුගේ පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ කරුණු අවසර ලබාගැනීමකින් තොරව ප්‍රකාශයට පත් කිරීම, බාලවයස්කරුගේ හෝ බාලවයස්කාරිනියගේ දෙමාපියන්ගේ කීතරීය හෝ අපකීතරීය හෝ තත්ත්වය මගින් හුදුවේ සාධාරනීකරණය කළ නොහැක.[27]

**අර්ථ නිරූපණය**

**'මහජන යහපත' යනු:**

ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ජනතාව විසින් තෝරාපත්කර ගනු ලැබූ නියෝජිතයින් ගේ සහ රජයේ ක්‍රියාකලාප පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.[28]

එසේම මහජන යහපත/ මහජන බැඳියාව යනු මහජන අභිරුචියට තුල්‍ය වූවක් නොවේ. මහජන යහපත මගින් බලාත්ප්‍රවේශයක් සාධාරණීකරණය කෙරෙන්නේ නම්, එය බරපතළ, යථායෝග්‍ය මහජන යහපතක් වනු විනා, හුදු කුතුහලය නොවිය යුතුය. පුද්ගලයින් තමන් දරණ හෝ අපේක්ෂා කරන මහජන භූමිකාවන් හි ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයට හෝ යෝග්‍යතාවයට බලපෑම් කරන අවස්ථාවන්හිදී හැරෙන්නට, පුද්ගලයෙකු මහජන ජීවිතයකට ඇතුළු වීම ඔස්සේ ඔවුන් තම පෞද්ගලික කටයුතු සඳහා ඇති පුද්ගලිකත්වයේ අයිතියට නුසුදුස්සන් නොකෙරෙනු ඇත.[29]

**මහජන යහපත/මහජන බැඳියාව යනු:**

---

*sexual offences (ලිංගික අපරාධ වාතර්‍ා කිරීම පිළිබඳ මාගෝපදේශය)*, ප්‍රවේශය: https://www.ipso.co.uk/member-publishers/guidance-for-journalists-and-editors/guidance-on-reporting-of-sexual-offences/.

[25] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php.

[26] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Editors' Code of Practice (සංස්කාරකවරුන්ගේ භාවිත සංග්‍රහය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php.

[27] ද රෙනෝල්ඩ්ස් ජනර්ලිස්ම් ඉන්ස්ටිටියුට් ඇන්ඩ් එතිකල් ජනර්ලිස්ම් නෙට්වකර් (n.d), *The Media Council's General Media Code of Ethics and Practice (මාධ්‍ය කවුන්සිලයේ පොදු මාධ්‍ය ආචාර ධමර් හා භාවිතා සංග්‍රහය)*, ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/Fiji-General.

[28] *ශ්‍රී ලංකා කර්තෘ සංසදය* (2015), *ශ්‍රී ලංකා* පුවත්පත් පැමිණිලි කොමිසම මගින් පිළිගත් *ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව*, ප්‍රවේශය: http://www.pccsl.lk/index.php/code-of-professional-practice-code-of-ethics-of-the-editors-guild-of-sri-lanka-adopted-by-the-press-complaints-commission-of-sri-lanka/.

[29] එතිකල් ජනර්ලිස්ම් නෙට්වකර් (n.d), *The Media Council's General Media Code of Ethics and Practice (මාධ්‍ය කවුන්සිලයේ පොදු මාධ්‍ය ආචාර ධමර් හා භාවිතා සංග්‍රහය)*, ප්‍රවේශය: https://accountablejournalism.org/ethics-codes/Fiji-General.

1. මහජන යහපතට/මහජන බැඳියාවට මතු දැක්වෙන කරුණු ඇතුලත් වන අතර, එසේ වුවත් එම කරුණුවලට සීමා වී නොමැත.

අ) අපරාධයක් හෝ අපරාධයක තර්ජනයක් නැතිනම් බරපතළ අනිසිතාවයක් සොයාගැනීම හා හෙළිදරව් කිරීම.

ආ) මහජන සෞඛ්‍යය සහ මහජන ආරක්ෂාව රැක ගැනීම.

ඇ) පුද්ගලයෙකු හෝ සංවිධානයක් මගින් කරන යම් ප්‍රකාශනයකින් හෝ ක්‍රියාවකින් මහජනතාව නොමඟ යැවීමෙන් ආරක්ෂා කිරීම.

ඇ) පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් ඔවුන් යටත් වන ඕනෑම නෛතික බැඳීමකට අවනත වීමට අපොහොසත් වීම හෝ අපොහොසත් වීමට ඇති හැකියාව අනාවරණය කිරීම.

ඇ) යුක්තිය අවගමනය වීමේ අවස්ථාවක් අනාවරණය කිරීම.

ඉ) බරපතළ අනිසිතාවයන්, සදාචාර විරෝධී හැසිරීම් හෝ මහජනතාවට අදාළ කරුණු පිළිබඳ අකාර්යක්ෂමතාව/ නොහැකියාව යන කරුණු ඇතුළත්ව මහජන සංවාදයක් ඇති කිරීම හෝ එවැන්නකට දායකත්වය ලබාදීම.

ඊ) ඉහත දැක්වෙන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් කරුණු සැඟවීමක් හෝ සැඟවීමට තැත් කිරීමක් අනාවරණය කිරීම.

2. ප්‍රකාශනයේ නිදහස තුළමද මහජන බැඳියාවක් තිබේ.

3. තොරතුරු, මහජන විෂයට දැනටමත් අයත් වන හෝ ඉදිරියේදී අයත් විය හැකි විස්තාරය පිළිබඳව නියාමකයා විසින් සලකා බලනු ඇත.

4. මහජන යහපත අදාළ කොට ගන්නා පුවත්පත් කලාවේදීන්/ කතුවරුන් විසින්, ප්‍රකාශනයක් හෝ ප්‍රකාශනය කිරීමේ අදහසින් සිදුකරනු ලැබූ ජනමාධ්‍යවේදී ක්‍රියාකාරකමක්, මහජන යහපතට යටත් වනට හා සමානුපාතික වන බවට සාධාරණව විශ්වාස කරන බව පෙන්වා දීමත්, එම මොහොතේදී එම තීරණයට ඔවුන් පැමිණි ආකාරයද පැහැදිලි කිරීමත් අවශ්‍ය වේ.

5. වයස අවුරුදු 16 ට අඩු දරුවන් සඳහා සාමාන්‍යයෙන් පරම වන ලැදියාවන් අභිබවා යාමට නම්, සුවිශේෂී මහජන ලැදියාවක් තිබීම අවශ්‍ය වේ.[30]

<u>**සැළකිය යුතුයි**</u>:

අප විසින් දක්වා ඇති ඉහත මාධ්‍ය ආචාර ධර්ම මාගෝප්පදේශන සංග්‍රහය සම්පාදනය කෙරී ඇත්තේ ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරව පවත්නා, ජනමාධ්‍ය ආචාර ධර්මයන් සම්බන්ධයෙන් කටයුතු කරනා පිළිගත් ආයතනයන් ඔස්සේ ඉදිරිපත් කොට ඇති ජනමාධ්‍ය ආචාර ධර්ම මාගෝප්පදේශනයන් මූලාශ්‍ර ලෙසින් ගනිමිනි. එම ආචාර ධර්ම මාගෝප්පදේශනයන් වෙනස් වීම, යම් යම් මාධ්‍ය ආචාර ධර්මයන් සම්බන්ධයෙන් ලෝකයේ සිදුවෙමින් පවත්නා කතිකාවන්ගේ වර්ධනයන් ඔස්සේ සිදුවන සංශෝධනයන්

---

[30] එඩිටසර් කෝඩ් ඔෆ් ප්‍රැක්ටිස් කමිටි (2019), *Privacy (පෞද්ගලිකත්වය)*, ප්‍රවේශය: https://www.editorscode.org.uk/the_code.php.

හෝ එකතු කිරීම් ඔස්සේ, අප විසින් ඉදිරිපත් කරනා ඉහත මාධ්‍ය ආචාර ධර්ම මාගෝප්පදේශන සංග්‍රහයද සංස්කරණයන්ට ලක් විය හැකි බව කරුණාවෙන් සලකන්න.

මෙම මාධ්‍ය ආචාර ධර්ම මාගෝප්පදේශන සංග්‍රහයේ පළමු කොටසේ එන කිසිදු කරුණක් අප විසින් නිර්මාණය කොට හෝ/ අප විසින් වෙනස් කොට නොමැති බවද කරුණාවෙන් සලකන්න.